චක්‍රලේඛ අංක:- 05/2005

බප/සසේකෙ/ලේ/නිර්
සමුපකාර සේවක කොමිෂන් සභාව,
50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2005.04.06

සියලුම විවිධ සේවා සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

<u>208:15 වෙළඳසැල් කළමණාකරු තනතුර</u>

ඉහත සඳහන් තනතුරට බඳවා ගැනීමේදී අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය යන විෂයයන්ට සම්මානලාභී අයදුම්කරුවන් සොයා ගැනීමේ අපහසුතාවය නිසා මෙම තනතුරට පුද්ගලයන් බඳවා ගැනීමේදී දුෂ්කරතා ඇති වන බව බොහෝ සමිති මගින් මෙම කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කර ඇත. එසේම 1993 වසරේ නිකුත් කර ඇති බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් මෙකී තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් 1/2003 සහ 2003.09.23 දිනැති චක්‍රලේඛය මගින් සංශෝධනය කර ඇත. එම සංශෝධනයන් අනුව 208:15 වැටුප් පරිමාණයේ තනතුරට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ සුදුසුකම ලෙස දක්වා ඇත්තේ සමුපකාර සේවා සාමාන්‍ය පෙළ සහතිකය/ අ.පො.ස. සාමාන්‍ය පෙළ අංක ගණිතය,/වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමාර්ථය සහ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවුරුදු 1 කට නොඅඩු පළපුරුද්ද ලබා තිබිය යුතු ය. යනුවෙනි.

අපහසුව සහ
02. කමුත් වසරක පළපුරුද්ද සහිතව සේවකයන් බඳවා ගැනීමේ/අවම වයස් සීමාව අවුරුදු 23 වීම නිසා එම වයස් සීමාව අඩු කළයුතු බවට ද කොයෙකුත් ඉල්ලීම් ඉදිරිපත් විය. මේ සම්බන්ධයෙන් සලකා බැලූ කොමිෂන් සභාව මෙම තනතුරේ සුදුසුකම් පහත සඳහන් පරිදි නැවත සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

| | |
|---|---|
| <u>තනතුරේ නම:-</u> | වෙළඳසැල් කළමණාකරු |
| <u>වැටුප් පරිමාණය:-</u> | 208:15 |
| <u>වැටුප් ක්‍රමය:-</u> | 43200-960X10-1020X8-60960 |
| <u>අවම වයස:-</u> | අවුරුදු 21 |
| <u>උපරිම වයස:-</u> | අවුරුදු 45 |
| <u>තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:-</u> | සමුපකාර සේවා 16 වන වැටුප් පරිමාණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවුරුදු 2 කට නොඅඩු පළපුරුද්ද හෝ සමුපකාර සේවා සාමාන්‍ය පෙළ සහතිකය/ අ.පො.ස. සාමාන්‍ය පෙළ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය සහ සිංහල/ |

දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථයක් ලබා තිබීම.

අදාල ශ්‍රේණියේ කනතුරක අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබෙන අපේක්ෂකයන් සඳහා සම්මුඛ පරීක්ෂණයට නියමිත ලකුණු ප්‍රමාණයෙන් 20% ක වැඩිපුර ලකුණු ප්‍රමාණයක් ලබා දෙනු ලැබේ.

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-

1. බස්නාහිර පළාතේ සමුපකාර, ක්‍රීඩා හා යොවන කටයුතු අමාත්‍ය තුමා ගේ පෞද්ගලික ලේකම්.
2. ප්‍රධාන ලේකම් (.බ.ප.)
3. ලේකම් – සමුපකාර, ක්‍රීඩා හා යොවන කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ, කළුතර, ගම්පහ )
6. ලේකම් – සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් වරුන්
8. සියලුම වෘත්තිය සමිති සංගම්